සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

29925

## 6 - ශ්‍රේණිය

## විද්‍යාව

නම/විභාග අංකය:- ............................................................................ කාලය: පැය 2යි.

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.

1. ගසක සිටින කුරුල්ලෙකු වඩාත් හොඳින් නිරීක්ෂණයට සුදුසු උපකරණය වන්නේ කුමක් ද?
(1) අණ්වීක්ෂය (2) ප්‍රිස්ම දෙනෙතිය (3) දුරේක්ෂය (4) අත්කාචය

2. මෙම රූපයේ දැක්වෙන ජීවියා ගන්නා ආහාර අනුව කුමන කාණ්ඩයකට අයත් වේ ද ?



(1) ශාක භක්ෂක (2) සර්ව භක්ෂක
(3) මාංශ භක්ෂක (4) කෘමි භක්ෂක

3. එක්තරා ජීවියෙකුට පහත දැක්වෙන ලක්ෂණ තිබේ. එම ජීවියා කවරෙකු විය හැකි ද?
A – අනාකුල හැඩය තිබීම. B – ශ්වසනයට කරමල් තිබීම
(1) කකුළුවා (2) තාරාවා (3) බලයා (4) ගෙම්බා

4. ස්කන්ධය හා දිග මැනීමේ අන්තර්ජාතික ඒකක පිළිවෙළින් දැක්වෙන්නේ කුමකින් ද?
(1) kg, m (2) g, m (3) KG, M (4) Kg, M

5. ශාක පත්‍ර සහිත අත්තක් පොලිතීන් බෑගයකින් උරයක් ගැටගසා සූර්යාලෝකය වැටීමට සලස්වා විනාඩි 30කට පසු බැලූ විට එම උරය තුළ ජල බිඳිති රැඳී තිබුණි. ශාක පත්‍රවලින් ජල බිඳිති පිටවූ ක්‍රමය විය හැක්කේ,




(1) වාෂ්පීභවනය (2) ඝනීභවනය
(3) වාෂ්පීකරණය (4) උත්ස්වේදනය

6. සූර්යග්‍රහණයක දී පෘථිවිය, චන්ද්‍රයා හා සූර්යයා ඒකරේඛීයව පිහිටයි. එසේ පිහිටන අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කවරක ද?
(1) චන්ද්‍රයා, පෘථිවිය හා සූර්යයා ය. (2) පෘථිවිය, චන්ද්‍රයා හා සූර්යයා ය.
(3) සූර්යයා, චන්ද්‍රයා හා පෘථිවිය ය. (4) සූර්යයා , පෘථිවිය හා චන්ද්‍රයා ය.

7. යකඩ මල බැඳීමට අවශ්‍ය සාධක සෙවීමේ පරීක්ෂණයක දී රූපයේ දැක්වෙන පරිදි උපකරණ අටවන ලදී. නළය තුළට කැල්සියම් ක්ලෝරයිඩ් යෙදීමෙන් කුමක් සිදුවේ ද?
(1) ජල වාෂ්ප උරා ගැනීම.
(2) ඔක්සිජන් වායුව උරා ගැනීම.
(3) කාබන්ඩයොක්සයිඩ් වායුව උරා ගැනීම.
(4) නයිට්‍රජන් වායුව උරා ගැනීම.



8. පෘථිවිය සෑදී ඇති ස්තර පිළිවෙළින් දැක්වෙන්නේ කුමන පිළිතුරෙහි ද?
(1) කබොල, ප්‍රාවරය, හරය (2) හරය, කබොල, ප්‍රාවරය
(3) කබොල, හරය, ප්‍රාවරය (4) ප්‍රාවරය, හරය, කබොල

9. දැඩි නියං සමයක පරිසරයේ නොතිබිය හැකි ලක්ෂණයක් වන්නේ,
(1) පොළොව ඉරි තැළී තිබීම. (2) තදින් හිරු පායා තිබීම.
(3) ගස් කොළන්වල ඉපල් දක්නට ලැබීම. (4) අහස වලාකුළින් බරවීම.

10. ජල චක්‍රයට ජලය එකතු වන ක්‍රමයක් නොවන්නේ කුමක් ද?
(1) ජලාශවලින් වාෂ්පීභවනය වීම. (2) පොළොවෙන් වාෂ්ප වීම.
(3) සතුන්ගේ ශ්වසන ක්‍රියාවලිය. (4) හරිත ශාකවල ආහාර නිපදවීම.

11. කනේරු ශාකය, පහත දැක්වෙන කුමන ශාක වර්ගයකට අයත් වේ ද?
(1) අපි ශාක (2) ශුෂ්ක ශාක (3) ජලජ ශාක (4) කඩොලාන ශාක

12. සංයුක්ත පත්‍ර දරන ශාකය මෙම ශාක අතරින් කුමක් ද?
(1) ඔකිඩ් (2) කරපිංචා (3) නුග (4) අඹ

13. මෙම උපකරණය මගින් ආහාර පිසීමේ දී භාවිත වන සූර්යය ශක්තියේ අඩංගු ශක්ති ප්‍රභේදය කුමක් ද?
(1) විභව ශක්තිය (2) තාප ශක්තිය
(3) ආලෝක ශක්තිය (4) ඉහත සියල්ලම



14. පරිසර දූෂණයට වැඩියෙන්ම දායක වන්නේ පහත සඳහන් කුමන ක්‍රියාවලියකින් විදුලිය නිපදවීම ද?
(1) ඉන්ධන දහනය කිරීමෙන් (2) සූර්ය කෝෂ භාවිත කිරීමෙන්
(3) සුළගේ ශක්තිය උපයෝගී කර ගැනීමෙන් (4) ගලා යන ජලයේ ශක්තිය යොදා ගැනීමෙන්

15. මල බැඳීම අඩු කරන ද්‍රව්‍යය කුමක් ද?
(1) දෙහි ඇඹුල් (2) සබන් (3) විනාකිරි (4) ලුණු

16. ජලාබුජ ඵල සහිත ශාකය තෝරන්න.
(1) මණ්ඩ (2) වැටකෙයියා (3) අඹ (4) හිරමණදැත්ත

17. බීජයේ එක් පියල්ලක් පමණක් ඇති ශාකය කුමක් ද?
(1) කොස් (2) අඹ (3) පොල් (4) රබර්

18. මිනිසාගේ සාමාන්‍ය ශරීර උෂ්ණත්වය කොපමණ ද?
(1) 37 °C ය. (2) 38 °C ය. (3) 34 °C ය. (4) 35 °C ය.

19. වායුගෝලයේ වැඩිපුරම ඇති වායුව කුමක් ද?
(1) ඔක්සිජන් (2) නයිට්‍රජන්
(3) කාබන්ඩයොක්සයිඩ් (4) හීලියම්

20. විශාල ශක්ති ප්‍රමාණයක් ක්ෂණිකව නිපදවීමට උදවු වන ශක්ති ප්‍රභවය කුමක් ද?
(1) ගලා යන ජලය (2) සුළඟ
(3) ජෛව ස්කන්ධ (4) පරමාණුවල ඇති න්‍යෂ්ටිය

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

**01.** සුනිල්, නිමල් හා කමල් තම විද්‍යා ගුරුතුමිය විසින් ස්වාභාවික අනතුරු පිළිබඳව ලබා දුන් මාතෘකා ඔස්සේ භූමිකා රංගනයකට අදාළ නාට්‍ය පිටපත් සකස් කරමින් සිටියහ. ඔවුන් තිදෙනාගේ පිටපත්වල තිබූ දෙබස් ඛණ්ඩය බැගින් පහත දැක්වේ.

සුනිල්ගේ පිටපත : - "මොකද අප්පේ මේ! මුහුද හිඳිලා .... රැල්ල නැත්තටම නැතිවෙලා. පතුලේ බොරළුත් මතුවෙලා. හැමෝම ඒ දිහාවට දුවනවා. මමත් යන්න ඕනේ."

නිමල්ගේ පිටපත : - "ඉක්මන් කරන්න, ඉක්මන් කරන්න. ඉස්සරහ කාණුවේ වතුරත් බොර වෙලා .. ඉස්කෝලේ බිත්තිත් ඉරි තළලලු. උඩහ කන්දෙන් මඩ වතුර කාන්දු වෙනවලු."

කමල්ගේ පිටපත : - "මා හමා එන්නේ, මට ඕනෑ විදියටයි. ඔබ කියයි, මා දරුණුයි, දඩබ්බරයි, හානි කරයි කියලා. නමුත් එය මගේ වරදක් නොවේ. මගේ පැමිණීම මටම පාලනය කර ගන්න බැහැ. වායුගෝලයේ සිදු වන වෙනස්වීම් නිසයි මට මෙහෙම වෙන්නේ. ඔබ, මගෙන් වන හානි අවම කර ගන්න දැනුවත් විය යුතුයි."

I. ස්වාභාවික විපතක් යනු කුමක් ද?
II. ඉහත සුනිල්, නිමල් හා කමල්ගේ පිටපත්වල අඩංගු වන ස්වාභාවික විපත් හඳුනාගෙන වෙන වෙනම ලියන්න.
III. සුනිල්ගේ පිටපතේ සඳහන් ස්වාභාවික විපත ඇති වීමට බලපාන සාධකයක් ලියන්න.
IV. සුනිල්ගේ පිටපත හා සම්බන්ධ ස්වාභාවික ව්‍යසනය ශ්‍රී ලංකාවට තදින් බලපෑ වර්ෂය හා දිනය කවදා ද?
V. නිමල්ගේ පිටපතේ සඳහන් ආකාරයේ ස්වාභාවික විපත් බහුලව පවතින්නේ ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශ ආශ්‍රිතව ද?
VI. දැඩි නියං තත්ත්වයක් ඇති වීමට සෘජුවම බලපාන මිනිස් ක්‍රියාකාරකමක් ලියන්න.
VII. කමල්ගේ පිටපතේ සඳහන් ස්වාභාවික විපත් මගින් බහුලව හානි සිදුවන්නේ ශ්‍රී ලංකාවේ කුමන පළාතකට ද?
VIII. අකුණු අනතුරුවලින් වැළැකීමට ගත හැකි ක්‍රියා මාර්ග 2ක් ලියන්න.
IX. ශ්‍රී ලංකාව ආශ්‍රිතව අකුණු අනතුරු බහුලව වාර්තා වන්නේ කුමන මාසයක ද?
X. මෑත කාලීනව නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ජල ගැලීම් බහුල වීමට බලපා ඇති ප්‍රබල හේතුව කුමක් ද?
XI. ස්වාභාවික ආපදාවකින් සිදු වන හානි අවම කරගැනීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් ලියන්න.
XII. ස්වාභාවික ආපදාවකට මුහුණ දීම සඳහා , පෙර සකසන ද්‍රව්‍ය කට්ටලයකට ඇතුළත් කළ යුතු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය 4ක් සඳහන් කරන්න.
XIII. පහත එක් එක් උපකරණවලින් මනිනු ලබන්නේ කුමක් ද?
a. අනිලමානය b. වර්ෂාමානය c. සුළං දිශා දර්ශකය d. පීඩනමානය

**02. (A)** පහත ද්‍රව්‍ය දී ඇති එක් එක් ගුණයට ගැළපෙන පරිදි යා කරන්න.

| | | |
|---|---|---|
| I. | භංගුර ද්‍රව්‍යයක් | මැටි |
| II. | පාරදෘශ්‍ය ද්‍රව්‍යයක් | ප්ලාස්ටික් |
| III. | සුවිකාර්ය ද්‍රව්‍යයක් | සල්ෆර් |
| IV. | තන්‍ය ද්‍රව්‍යයක් | පොලිතීන් |
| V. | තාප පරිවාරක ද්‍රව්‍යයක් | තඹ |